# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

# වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය - කොත්මලේ

KITI - IWM

## වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2026

කොත්මලේ, වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ජාතික වෘත්තීය කුසලතා 06 වන මට්ටම සඳහා ප්‍රතීතනය කර ඇති පූර්ණ රාජ්‍ය ආයතනයකි. මෙම ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික, අවිවාහක අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුහුණු පාඨමාලා දෙ අවුරුදු නේවාසික පුහුණුවකින් හා එක් අවුරුදු ක්ෂේත්‍ර පුහුණු කාලයකින් සමන්විත වේ.

**01. ආධුනිකයින් බඳවා ගැනීම**

- **අවම සුදුසුකම්**

i. අයදුම්කරු අ.පො.ස. (සා.පෙළ) විභාගය, සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් වරකින් සමත්වී තිබිය යුතුය.

ii. අ.පො.ස. (උ.පෙළ) විභාගය ගණිත විෂය ධාරාවෙන් විෂයයන් 03 ක් එක් වරකින් සමත්වී තිබිය යුතුය.

iii. අයදුම්කරු, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 25 ට අඩු යහපත් මානසික හා කායික සෞඛ්‍යයෙන් හෙබි අයෙකු විය යුතුය.

**02. පුහුණුව සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය**

ඉහත සුදුසුකම් වලට අමතරව, බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය පහත දක්වා ඇත.

i. සුදුසුකම් ලත් අපේක්ෂකයින් ප්‍රශ්න පත්‍රය සඳහා පැය 1 1/2 ක කාලයක් වෙන් කර ඇති තරගකාරී යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයකට සහභාගි විය යුතුය.

ii. ලිඛිත විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම් විස්තර**

i. ආයතනයේ වෙබ් අඩවියට (www.kitiiwm.gov.lk) පිවිසීමෙන් අදාළ අයදුම්පත් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය.

ii. අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත් යොමුකළ හැකි අවසාන දිනය 2026 අගෝස්තු මස 23 වන දින වේ.

iv. අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් සත්‍යාපනය කිරීම සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සහ අ.පො.ස. (උ.පෙළ) විභාග සහතිකවල ස්කෑන් කරන ලද පිටපත් (pdf) උඩුගත කළ යුතු අතර අයදුම්කරුගේ වයස සත්‍යාපනය කිරීම සඳහා උප්පැන්න සහතිකයේ ස්කෑන් කරන ලද පිටපතක් (pdf) උඩුගත කළ යුතුය.

**04. විශේෂ කොන්දේසි**

i. පුහුණු පාඨමාලාව පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

ii. මෙම පුහුණු පාඨමාලාවල අධ්‍යයන කටයුතු සඳහා යන සියලු වියදම්, ශ්‍රී ලංකා රජය මගින් දරනු ලබන අතර, නේවාසික පහසුකම්ද පුහුණු ආයතනය මගින් සපයනු ඇත. එහෙත් පුහුණු කාලය තුළදී, ආහාරපාන, භෞතික හා අනෙකුත් පෞද්ගලික වියදම් අභ්‍යාසලාභීන් විසින් දැරිය යුතු වේ.

iii. තෝරා ගනු ලබන අභ්‍යාසලාභීන්, අභ්‍යාස ආයතනයේ විනය හා ආචාර ධර්ම වලට යටත්ව පුහුණුව අවසන් කරන බවට මෙන්ම පුහුණු කාලසීමාව සාර්ථකව අවසන් කරන බවට බැඳෙන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

iv. තෝරාගත් අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වියයුතු අතර ලියාපදිංචි වන අවස්ථාවේදී සම්පූර්ණ කරන ලද පෝරමය ඉදිරිපත් කළ යුතුය.

v. පුහුණු කාලය අවසන් කිරීමට මත්තෙන්, පුහුණුවෙන් ඉවත් වන්නේ නම් එතෙක් ඔහු හෝ ඇය වෙනුවෙන් රජය මගින් දැරූ වියදම ආපසු ගෙවීමට බැඳී සිටින අතර, ඒ සඳහා වූ ඇප ගිවිසුමකට එළඹිය යුතුය.

vi. පුහුණු කාලය තුළ පවත්වනු ලබන සමාසික, වාර්ෂික මෙන්ම පුහුණු කාලය අවසානයේදී පවත්වනු ලබන අවසන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලදී සමත්වන ආධුනිකයවන් සඳහා NVQ - Leavel 6 මට්ටමේ ඩිප්ලෝමා සහතිකයක් පුහුණු ආයතනය විසින් නිකුත් කරනු ලබන අතර, පුහුණුවට අදාළ රැකියා ලබා දීමට, මෙම අමාත්‍යාංශය හෝ පුහුණු ආයතනය බැඳී නොසිටියි.

vii. අයදුම්කරුවන් වෙනත් කිසිදු උසස් අධ්‍යාපන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොතිබිය යුතුය.

**ඩී. පී. වික්‍රමසිංහ**
**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය.**